**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**

**යෝජනා කැඳවීම (RFP)**

**ආයෝජන සඳහා වන තනි කවුළුවක් (Single Window for Investment) ස්ථාපනය කිරීම සඳහා උපදේශන ආයතනයක් තෝරා ගැනීම**

**යොමු අංකය:** MF1/11/12(3)/SWS/P1/2026

**1.** මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙනුවෙන් අමාත්‍යාංශ උපදේශක ප්‍රසම්පාදන කමිටුවේ (MCPC) සභාපතිතුමන් විසින් **ආයෝජනය සඳහා තනි කවුළු පද්ධතියක් (Single Window for Investment) ස්ථාපනය** කිරීමේ උපදේශන සේවාව සැපයීම සඳහා මෙයින් යෝජනා කැඳවනු ලැබේ.

**2.** ඉහත ව්‍යාපෘතියේ උපදේශකත්වය සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය සුදුසුකම්:

- **2.1** පසුගිය වසර 10 ක කාලය තුළ යෝජිත කාර්යයන්ට සමාන හෝ ජාතික මට්ටමේ උපදේශන පැවරුම් අවම වශයෙන් තුනක් (03) සාර්ථකව නිම කර තිබීම.

**3.** මෙම සේවාවන් ඉටු කිරීම සඳහා තමන් සුදුසුකම් ලබා ඇති බව අඟවන තොරතුරු (අත්පොත්, සමාන පැවරුම් පිළිබඳ විස්තර, සමාන තත්ත්වයන් යටතේ ලැබූ පළපුරුද්ද, අනුයුක්ත කිරීමට නියමිත කාර්ය මණ්ඩලය සතු සුදුසු නිපුණතාවල පවතින බව, ආදිය) උනන්දුවක් දක්වන උපදේශකයින් විසින් ඉදිරිපත් කළ යුතුය.

**4.** ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය විසින් ප්‍රකාශිත, 2007 අගෝස්තු සංස්කරණයේ 'උපදේශකයින් තෝරා ගැනීම සහ සේවයේ යෙදවීම' පිළිබඳ මාර්ගෝපදේශවල සඳහන් ප්‍රතිපත්තිවලට අනුකූලව, මෙම යෝජනා කැඳවීම් ලේඛනයේ විස්තර කර ඇති ක්‍රියාපටිපාටීන් සහ **ගුණාත්මකභාවය හා පිරිවැය පදනම් කරගත් තේරීම් (QCBS)** ක්‍රමවේදය යටතේ උපදේශන ආයතනය තෝරා ගනු ලැබේ.

**5.** උනන්දුවක් දක්වන උපදේශකයින්හට ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙල කරන ලද සම්පූර්ණ අයදුම්පත් ලේඛන කට්ටලයක්, සිය ලිඛිත ඉල්ලීම, කාමර අංක 217, අධ්‍යක්ෂ, මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමෙන් 04.08.2026 සිට 24.08.2026 දක්වා රාජකාරී දිනවල පැය 0900 සිට පැය 1500 දක්වා කාලය තුළ, ආපසු ගෙවනු නොලබන රු. 10,000.00 ක ගාස්තුවක් (සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද - SSCL සහ එකතු කළ අගය මත බද්ද (VAT ඇතුළත්ව)) ගෙවා මිලදී ගත හැක. ගෙවීම් මුදලින් සිදු කළ යුතු වේ.

**6.** අයදුම්පත් ලේඛන සාමාන්‍ය කාර්යාල වේලාවන් තුළ මුදල් අමාත්‍යාංශයේ අංක 217 කාමරයේ දී නොමිලේ පරීක්ෂා කළ හැක. වැඩිදුර විස්තර සඳහා කරුණාකර අධ්‍යක්ෂ (ආයතනික කටයුතු) දුරකථන අංක 0112 484 600 (දිගුව: 1581) ඔස්සේ සම්බන්ධ කර ගත හැකිය.

**7.** ලංසු, සීල් තැබූ කවර දෙකක බහා (තාක්ෂණික හා මූල්‍යමය වෙන වෙනම) **2026.08.25** වන දින පැය 14.00 (ප.ව. 2.00) ට හෝ ඊට පෙර **සභාපති, අමාත්‍යාංශ උපදේශක ප්‍රසම්පාදන කමිටුව, මුදල් අමාත්‍යාංශය, මහ ලේකම් කාර්යාලය, කොළඹ 01** යන ලිපිනයට පැමිණ, **අංක 217 දරන කාමරයේ** තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීම **හෝ ලියාපදිංචි තැපෑලෙන්** එවිය හැකිය. ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ **"SELECTION OF A CONSULTANCY FIRM FOR ESTABLISHMENT OF A SINGLE WINDOW FOR INVESTMENT"** (ආයෝජන සඳහා ඒකල කවුළුවක් ස්ථාපනය කිරීම සඳහා උපදේශක ආයතනයක් තෝරා ගැනීම) ලෙස සඳහන් කළ යුතුය. **ප්‍රමාද වී ලැබෙන යෝජනා ප්‍රතික්ෂේප කරනු ලැබේ.** තාක්ෂණික යෝජනා, ලංසු භාරගැනීමේ වේලාව අවසන් වූ වහාම විවෘත කරනු ලබන අතර, ඒ සඳහා උපදේශන ආයතනයේ නියෝජිතයෙකුට හෝ උපදේශන ආයතනයේ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැක.

**8.** යෝජනාපත්‍ර පූර්ව සාකච්ඡාව 2026.08.11 දින පෙ.ව. 10.00ට, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ, නව ගොඩනැගිල්ලේ, නව ශ්‍රවණාගාරය (2වන මහල) දී පැවැත්වීමට නියමිතය.

**සභාපති**
උපදේශක ප්‍රසම්පාදන කමිටුව
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය
කොළඹ 01